මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

**සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් කටයුතුවලින් ඇමරිකානු ඩොලර් ලක්ෂ 6 කට ආසන්න මුදලක් මහා භාණ්ඩාගාරයට ලැබී ඇත.**

සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් කටයුතු ව්‍යාපාරයක් ලෙස කරගෙන යාම සඳහා අවශ්‍ය පසුබිම උදා වී ඇති අතර ඒ සඳහා ප්‍රවේශයක් සූදානම් වී ඇත.

2025 වර්ෂයේ මුදල් අමාත්‍යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන භාවිතා කරමින් මෙම වාණිජ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් වියදම් දරා ඇති අතර, සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් ආරම්භ කර මේ දක්වා ගත වූ මාස කීපයක කාලය තුළ ඇමරිකානු ඩොලර් ලක්ෂ 6 කට ආසන්න ආදායමක් මහා භාණ්ඩාගාරයට ලබා දී ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් සිදු කරගෙන යනු ලබන මෙම මෙහෙයුම් කටයුතු තුළින්, ගෝලීය සමුද්‍රීය ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතු අන්තර්ජාතික වගවීම රජයක් ලෙස වඩා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වනවා මෙන්ම ජාතික ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබා දීමට ද අවකාශය සැලසී ඇත. එසේම, කලාපීය මෙන්ම ජාත්‍යන්තර සමුද්‍ර කලාප තුල දී මෙම ලබා දෙන සේවාවන් තුළින්, වගවීමෙන් මෙන්ම ඉහල ඵලදායීතාවයකින් යුතු ආරක්ෂාකාරී සේවයක් සේවාලාභීන් වෙත ලැබෙනු ඇත.

මෙම වාණිජ ප්‍රවේශය මඟින් සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් කටයුතු සිදු කිරීමට මඟ පෑදීම තුළින් ආර්ථික, සමාජීය සහ භූදේශපාලනික වශයෙන් ඉතා ධනාත්මක ප්‍රතිලාභ ලබා කර ගැනීමට රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට හැකි වනු ඇතැයි බලාපොරොත්තු වේ. එමෙන්ම, ඉතාමත් කාර්යක්ෂම හා ඵලදායී වාණිජ සේවාවක් නැව් සමාගම්වලට ලබා දීම හරහා රට තුලට විදේශ විනිමය ගලා ඒමට ද අවස්ථාව උදා වී ඇත. ජාත්‍යන්තර වෙළඳ නාවික ගමනාගමන කටයුතුවලට සහභාගී වීමට ශ්‍රී ලංකාවට ඉහල අවස්ථාවක් පවතින අතර ඒ තුළින් ගෝලීය වෙළඳ දාමයන් හා පවතින සම්බන්ධතාව තිරසාරව ස්ථාපිත කිරීමට මෙන්ම ඉහල ගුණාත්මක සේවාවක් ලබාදෙන්නෙකු තුළින් ඉදිරියේදී නව අවස්ථාවන් උදා කර ගැනීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය